# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2135/63 – 2019 අගෝස්තු 09 වැනි සිකුරාදා – 2019.08.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

33 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: GCF/ATH/CB/22/LR.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ
යොමු අංකය: 03/J/92/LRB/133.

මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ 1993.07.12 වැනි දින ප්‍රසිද්ධ කරන ලද අංක 775/3 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1993 අංක 100 දරන 38(අ) අතුරු විධාන ආඥාව මගින් රජයට පවරාගෙන ඇති මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක 7775 දරන මූලික පිඹුරට ඇතුළත් කැබලි අංක 01, 04 සහ 05න් පහත උපලේඛනයේ විස්තර කර ඇති හිමිකම් සනාථ නොවූ ඉඩම් කොටස සඳහා ගෙවිය යුතු වන්දි මුදල ඉඩම් අත්කර ගැනීමේ පනතේ 33 වන වගන්තිය යටතේ කොළඹ දිසා අධිකරණයේ තැන්පත් කර ඇති බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

පහත ඉඩම් කොටසට හිමිකම් කියන අය වෙතොත් තම හිමිකම් කොළඹ දිසා අධිකරණය වෙත ඉදිරිපත් කර තමන්ට හිමි වන්දි මුදල ලබාගන්නා ලෙස මහජනයාට මෙයින් නිවේදනය කරමි.

සී. ඩබ්ලිව්. අබේසූරිය,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.

2019 අගෝස්තු මස 07 වැනි දින,
මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ ව්‍යාපෘතිය,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,
ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර පාර, වැලිකඩ, රාජගිරිය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1. | පළාත | : | බස්නාහිර |
| 2. | දිස්ත්‍රික්කය | : | කොළඹ |
| 3. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | කොළඹ |
| 4. | ගම | : | බ්ලූමැන්ඩල් |
| 5. | ඉඩමේ නම | : | සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ, වරි. අංක 579/2 හි කොටසක් |
| 6. | මූලික පිඹුරු අංකය | : | 7775 |
| 7. | කැබලි අංකය | : | 01, 04 සහ 05 හිමිකම් සනාථ නොකළ |
| 8. | ප්‍රමාණය | : | පර්. 213.58 |
| 9. | දිසා අධිකරණය | : | කොළඹ |
| 10. | නඩු අංකය | : | DLA 135/18 |
| 11. | තැන්පත් කරන ලද මුදල | : | රු. 215,68,374.60 (රුපියල් දෙකෝටි පහළොස් ලක්ෂ හැට අට දහස් තුන්සිය හැත්තෑ හතරයි ශත හැටක් පමණි) |

08 – 902

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

33 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: DIVWE/LND/ACQUI/05/11/1489.

2019.06.27 දින පළ කරන ලද 2129/85 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 07 – 372/9 දරන දැන්වීමේ කැබලි අංක 165 හි ''නඩු අංකය 8877/එල්ජ්'' ලෙස මුද්‍රණ දෝෂයකින් සාවද්‍ය ලෙස පළවී ඇත. එය ''නඩු අංකය 8777/එල්ජ්'' ලෙස සංශෝධනය විය යුතුය.

ප්‍රාදේශීය ලේකම්,
වීරඹුගෙදර.

08 – 903